**ආයුර්වේද වෛද්‍ය සභාව - 2018**

-------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 132 ඡේදය ප්‍රකාරව, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සභාව වෙත ලැබෙන රාජ්‍ය ප්‍රදානවලට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට ආයුර්වේද වෛද්‍ය සභාවට ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්කරණයට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී පවත්වා තිබුණු වැඩමුළුවක වියදම් සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙතින් සභාව වෙත ලැබී තිබුණු රු.67,500 ක ආදායම හා වියදම ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

**1.5.3 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ II (1) (ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු හා අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ එක් ආචාර්යවරයෙකු සභාවේ සාමාජිකයකු ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයින් හතරදෙනා පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඡන්ද විමසීමෙන් පත් කරගත යුතු සාමාජිකයින් තිදෙනා 2019 වර්ෂය අවසන් වීමට පෙර පත් කිරීමට කටයුතු කරනු ලබන බව හා ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්යවරුන් අතරින් එක් ආචාර්යවරයෙකු පත්කිරීම සඳහා අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය වෙත දැනුම් දී ඇති බව. | ආයුර්වේද පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ඉක්ම වූ වෛද්‍යවරු 6,199 ක් ලියාපදිංචිය අළුත්කර නොතිබුණි. ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අහිමිව තිබුණු ආදායම රු.6,955,250 ක් විය. | මේ සම්බන්ධව අදාළ වෛද්‍යවරුන් දැනුවත් කර ඇති බව, ලියාපදිංචිය අළුත් කර නොමැති වෛද්‍යවරුන් සඳහා සභාව මඟින් කිසිදු කාර්යයක් ඉටු නොකිරීම, කිසිදු පුහුණු පාඨමාලාවකට යොමු නොකිරීම, 2019 වර්ෂයේ සිට වර්ෂයකට රු.300 ක් බැගින් ප්‍රමාද ගාස්තුවක් අයකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | ඉකුත් වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වාදී තිබුණු නිර්දේශයන් 2019 මැයි 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආයතන සංග්‍රහය XXI වැනි පරිච්ඡේදය | ආයතන සංග්‍රහය ප්‍රකාරව, නිල ඇඳුම් හිමිකම් නොලබන නිලධාරීන් 10 දෙනෙකු වෙත නිල ඇඳුම් ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.95,800 ක් වැයකර තිබුණි. | ආයුර්වේද පනතින් වෛද්‍ය සභාව වෙත ලැබී ඇති බලතල අනුව හා සභාවේ අනුමැතිය මත මෙම නිල ඇඳුම් වාර්ෂිකව ලබා දෙනු ලබන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ iv වගන්තිය | අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා පදනම් කරගන්නා කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කර නොතිබුණි. පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කර නොතිබියදී 2018 වර්ෂය සඳහා රු.730,440 ක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 6.5.3 වගන්තිය | 2016 හා 2017 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2019 ජුනි 03 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති බව, 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 9.3.1 වගන්තිය. | වෛද්‍ය සභාවේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන ලේඛකාධිකාරී තනතුරට අවශ්‍ය බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ලේඛකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කොට වෛද්‍ය සභාවෙන් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව, සභාවේ පවත්වනු ලබන අනුකමිටු 06 කට, පූර්ව විමර්ශන කමිටුවකට හා දන්ඩනීය කාරක සභාවකට සහභාගීවන නිලධාරීන්ට රු.1,000 ක් බැගින් වූ සහභාගීවීමේ දීමනාවක් වශයෙන් මුළු මුදල පිළිවෙලින් රු.146,000 ක්, රු.21,000 ක් හා රු.11,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇති බව. | ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | සභාවේ මාසික ලාභය රු.180,000 ඉක්මවන විටදී රු.1,800 ක මාසික දිරි දීමනාවක්ද, වැඩිවන සෑම 10,000 කටම සියයට 0.5 ක් ලෙස උපරිමය රු.2,800 ක මාසික දිරි දීමනාවක්ද සභාවේ නිලධාරීන්ට ගෙවීමට 2015 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් එවැනි ලාභයක් ලැබී නොතිබුණු 2015 හා 2016 වර්ෂවලදී මෙන්ම ඌනතාවයක් ලැබී තිබුණු 2017 හා 2018 වර්ෂවලදී, මාසික ආදායම පදනම් කර ගෙන රු.1,286,058 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | මේ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් පැහැදිළි කර ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතිය සහිත දිරි දීමනා ගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,906,516 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.765,079 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,141,437 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සාමාන්‍ය පොදු වියදම් රු.1,101,913 කින්, මූල්‍ය වියදම් රු.580,091 කින් හා වෙනත් වියදම් රු.591,384 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු, වෙනත් ආදායම්, සාමාන්‍ය පොදු වියදම්, මූල්‍ය වියදම් හා වෙනත් වියදම් පිළිවෙලින් සියයට 46 කින්, සියයට 42 කින්, සියයට 11කින්, සියයට 362 කින් හා සියයට 44 කින් වැඩිවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී ජංගම අනුපාතය සියයට 2.8 කින් අඩුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේදී නව සහතිකයක් නිකුත් කිරීමටත්, එම සහතික පත් 6,000 ක් මුද්‍රණය කිරීමටත් කටයුතු කර තිබුණි. 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීමට මුදල් ගෙවා තිබුණු වෛද්‍යවරු 4,993 දෙනෙකුගෙන් 197 දෙනෙකු වෙත පමණක් නව සහතික නිකුත්කර තිබුණි. එසේම ආයුර්වේද වෛද්‍ය සභාවේ වෛද්‍යවරු හා පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීම, විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | මේ වන විට මුදල් ගෙවා ඇති වෛද්‍යවරුන් 1,124 කට සහතික පත්‍ර නිකුත් කර ඇති බව, වෛද්‍යවරුන් සියළු දෙනාට මෙම වසර අවසන්වීමට පෙර සහතික පත්‍ර නිකුත් කර අවසන් කිරීමට කටයුතු කරන බව. | 2015 දෙසැම්බර් 08 දිනැති පාලක සභාවේ නිර්දේශය පරිදි ලියාපදිංචි වෛද්‍යවරුන් වෙත සහතිකපත් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2018 ජූලි 21 හා 22 දිනයන්හි පවත්වා 2019 මාර්තු 01 දින ප්‍රතිඵල නිකුත්කර තිබුණි. එක් එක් විෂයය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය සියයට 40 ක් වී තිබුණු නමුත් අවම ලකුණු ලබා නොගත් සියයට 36.5 සිට සියයට 39.7 ක අසමත් ලකුණු පරාසයක සිටි ඌන සමත් 09 දෙනෙකු හා අසමත් 09 දෙනෙකු පිළිවෙලින් සමත් කිරීමට හා ඌන සමත් කිරීමට විභාග පාලක මණ්ඩලයේ එක් සාමාජිකයෙකුගේ අත්සන යෙදීමෙන් පමණක් විභාග ප්‍රතිඵල වෙනස්කර තිබුණි. නමුත් එම අසමත් ලකුණු පරාසය තුළ ලකුණු ලබාගත් තවත් අයදුම්කරුවන් 09 දෙනෙකු සමත් කිරීමට හෝ ඌන සමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බැලීමට විමර්ශන කමිටුවක් පත් කළ බව හා කමිටු වාර්තාව ලද පසු අවශ්‍ය පියවර ගන්නා බව. | විධිමත් පරීක්ෂණයක් කර අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයුර්වේද පනත හා විනය නියෝග කාලීනව සංශෝධනය කර පැමිණිලි කඩිනමින් විමර්ශනය කළ හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ව්‍යාජ වෛද්‍යවරුන් සම්බන්ධ පිළිවෙලින් පැමිණිලි 13 ක් හා පැමිණිලි 14 ක් ලැබී තිබුණි. ඉන් පිළිවෙලින් පැමිණිලි 03 ක හා 10 ක විමර්ශන කටයුතු 2019 ජුනි 12 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර විමර්ෂන කටයුතු අවසන් කර තිබුණු පිළිවෙලින් පැමිණිලි 10 කට හා 04 කට අදාළව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් විමර්ශනය කළ බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි. | ආයුර්වේද පනත සංශෝධනය කිරීම අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු බව, විනය නියෝග සංශෝධනය කිරීමට ඇති යෝජනා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන බව,<br>එම ක්‍රමවේදය ස්ථාපිත වූ පසු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශණය කළ හැකි බව හා මූලික විමර්ෂණ අවසන් කළ 14 දෙනෙකුගේ දණ්ඩනීය අවස්ථා කාරක සභාව හමුවට කැඳවීමට පෙර නිදහසට කරුණු විමසා ඇති බව. | ආයුර්වේද පනත හා විනය නියෝග කාලීනව සංශෝධනය කර පැමිණිලි කඩිනමින් විමර්ශනය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකළ යුතු උපාය මාර්ග 09 කට අදාළ ක්‍රියාකාරකම් 16 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණි. | 2018 වර්ෂයේ ඉටු කර ගැනීමට නොහැකි වූ ක්‍රියාකාරකම් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර ඇති අතර එම අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන බව. | වර්ෂය තුළදී ළඟා කර ගතහැකි ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කළ යුතු අතර සුදුසු පරිදි ක්‍රියාකාරී සැළැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පිළියෙල කළද, විගණන පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ලබා ගත යුතු ලිපි ලේඛන ලබා ගැනීමට ප්‍රමාදවීම නිසා නියමිත | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 27 ක ප්‍රමාදයක් සහිතව 2019 මාර්තු 27 දින ඉදිරිපත් කර තිබුණි. | දිනට ඉදිරිපත් කළ නොහැකි වූ බව හා 2019 වර්ෂයේ සිට නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | |

## 4.2 තිරසාර සංවර්ධන අරමුණු
--------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව වෛද්‍ය සභාවේ විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් බව. | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |